විද්‍යාගේ සිට සේයා දක්වා

පහුගිය පළමුවෙනිදා අපූරු දිනයක්. ලෝක ළමා දිනයත් වැඩිහිටි දිනයත් පැමරුනේ එකම දවසේ. ළමයිනුත් වැඩිහිටියනුත් ජීවිතේ යම් කාලසීමාවකදී සමාන වෙනවා කියන එක බොහෝ දෙනා දන්නා සත්‍යයක්නෙ. ඒ නිසා මේ දෙගොල්ලො ගැනම එකම විදිහට ලියන්න පුලුවන් වෙන්නේ මේ

දෙගොල්ලන්ටම තමන්ගේ පැවැත්මට අනෙකෙකුගේ උපකාරය අවශ්‍ය වෙනවාය කියන පොදු කාරණය නිසා. ලෝකය කෙසේ වෙතත් අපේ රටේ මේ දෙපිරිසම පත්වෙලා ඉන්න තත්වය ගැන දිනපතා මාධ්‍ය හරහා බොහෝ තොරතුරු ඔබ දන්නවා ඇති. මම ඒ සිදුවීම් සෝද සෝදා මඩේ දමින්නට සූදානම් වෙන්නේ නැහැ. ඒත් ඒ සිදුවීම් හරහා ඔබ අප මේ වන විට පැමිණ ඇති විනිශ්චයන් ගැන යමක් ලිවිය යුතුමය කියා හිතුණා. මොකද යමක් ගැන ඇතිවන සෘණ ආකල්ප එහි පරිහානියට ප්‍රධාන සාධකයක් වන නිසා.

පසුගිය දිනවල සිදුවූ ළමා අපරාධ හරහා අපේ සමාජයේ සිදුවී ඇති සංස්කෘතික පරිහානිය ගැන බරපතළ කතිකාවක් මතුවුණානේ. බහුතරය කම්පාවුණේ වර්තමානය හා අනාගතය ගැන. සරළව හා මතුපිටින් බලා අප මේ ගැන බොහෝ කම්පා වුණත් යථාර්ථය නම"එය නොවෙයි. තවමත් අපේ සමාජය සිටින්නේ මේ බෙදවාචකයෙන් පහසුවෙන් ගොඩ දැමිය හැකි තැනකයි. හරි විමර්ශනයක් කළහොත් මෙවැනි අපරාධ සබ්‍යත්මත වශයෙන් ඉතා අල්ප බව පෙනී යනවා නිසැකයි. මේ ළමා අපරාධ හා අපයෝජන සම්බන්ධයෙන් මැදිහත් වන පුද්ගලයන් ප්‍රතිශතයක් වශයෙන් ගතහොත් ඉතා අඩු සංඛ්‍යාවක්. බහුතරය තවමත් හොඳයි කිවහැකියි.

අපේ සමාජයේ ආදරය සෙනෙහස රැකවරණය ආරක්ෂාව නැතිවී නැහැ. සමාජය ක්‍රමයෙන් පරිහානියට පත්වී ඇති බව සත්‍යයක්. එහි තේරුම අපේ මිනිස්සු සම්පූර්ණයෙන්ම ජරා ජීර්ණ වී ඇති බව නොවෙයි. මට නම් හිතෙන විදිහට ප්‍රශ්නය වී ඇත්තේ අපේ සමාජයේ බහුතරයකට තමන්ගේ සමාජමය වගකීම කුමක්ද යන්න ගැන සබුද්ධික වීමේ අඩුපාඩුවයි. එය සමාජයේ පහළ සිට ඉහළට ඇති අඩුවක්. උදාහරණයකට සේයාගේ හා විද්‍යා දියණියන්ගේ සිට සිදුවූ හැම සිද්ධියකදීම අපේ පොලිසියත් මාධ්‍යත් හැසිරුණ ආකාරය කොතරම් පසුගාමීද යන්න තේරුම් ගත හැක්කේ අසල්වැසි ඉන්දියාවේදී මෙවැනි සිද්ධි සිදුවුණ විට ඔවුන් ක්‍රියාකරන ආකාරය දුටු විට ය. එහිදී පෙරට වී තිබුණේ නීතියට වඩා වගකීම හා සදාචාර සම්පන්නභාවයයි.

ඒ නිසා සමාජයක ගමන් මගේදී සිදුව සිද්ධීන් අරභයා මුළු සමාජයට හෙළා තලා දැමීම යුක්ති සහගත නොවන බව අප තේරුම් ගත යුතුයි. මට තේරෙන විදිහට නම් අපේ සමාජයේ මිනිස්සු බහුතරය ඉතා හොඳයි. නමුත් ඔවුන් බොහෝ විට දන්නේ අනුන්ගේ වගකීම කුමක්ද යන්න මිස තමන්ගේ වගකීම කුමක්ද යන්න ගැයින නොවේ. අවුල ඇත්තේ එතැනයි.

සම්මානයක්ද අවමානයක්ද?

පිස්සු පීකුදු වෙන සම්මාන උළෙලක් ගැන කතාවක් පහුගිය දාක පාර්යකක කතාවක් ගියා. ඒක ගැන නම් අම්මපා ලියන්නම වටිනවා. පහුගිය වතාවෙ මාත් ගොඩ්බයා වගේ ටිකටි එකකුත් අරගෙන ඔය අටමගලෙ බලන්න ගිය නිසා ෆස්ට් හෑන්ඩ් අත්දැකීමකුත් තියෙනවා..

කතාව පටන් ගන්න ඕනෙ මෙතනින්. අපේ ගරුතර ශ්‍රී ලාංකිකයෝ සම්මාන වලට මාර ආසයි අප්පා. වේදිකාවක් උඩට නැගලා සම්මානයක්ය කියලා දෙන වීදුරු කෑල්ලක් හරි ලෝහ කෑල්ලක් හරි ආඩම්බරෙන් අරගෙන පින්තූරයකුත් ගහලා ෆේස්බුක් එකේ දාන්න අපේ අයට තියෙන ආසාව ගැන ලියන්න වචන මා ළඟ නං නැහැ. මේ මාර අහිංසක ආසාව හරියටම තේරුම් අරගෙන ඒක වෙළඳ ව්‍යාපාරයක් කරගත්ත මිනිහෙක් තමයි මේ කතාව පිටිපස්සෙ ඉන්නෙ. මිනිහ මුළින්ම කරන්නෙ සමාජයේ යමක් කමක් තියෙන කැපී පේන අයගෙ ලැයිස්තුවක් හදාගන්න එක. ඉන්පස්සෙ මිනිහා මේ අයට කතා කරනවා.

"ඔයාට මේ අවුරුද්දෙ සම්මානයක් තියෙනවා. උත්සවේට ඇවිත් ඒක ගන්න"

ඉතිං අනේ මේ නිකං දෙන සම්මානෙ ගන්න අකැමැති කවිද.? යනවා සම්මානෙ ගන්න. නිකම් නෙවෙයි පවුලේ අයත් එක්ක. ටිකට් එකක් ඩොලර් 150 යි. වේදිකාවට නැගලා ආඩම්බරෙන් සම්මානය ගන්නවා. ඊළඟට ෆෝටෝ එක. ඒකටත් ඩොලර් සීයක් වත් ගෙවන්න ඕනෙ. වැඩි වැඩියෙන් සම්මාන දුන්න තරමට සංවිධායක භවතාගේ කල්ල මරේ. ලොකුම කණගාටුව සමාජයේ දැනුම් තේරුම් තියෙන අය හැටියට අපි අඳුනාගෙන ඉන්න අයත් කැත නැතුව ගිහින් මේ සම්මානය ගන්න

එකනෙ.
සම්මාන උළෙලක් පැවැත්වීමත් සමාජයේ ගරු කටයුතු පුද්ගලයින් අඟැයීමකට ලක්කිරීමත් ඉතාම වැදගත් දෙයක්. නමුත් වැදගත් වන්නේ උළෙලේ ගාම්භීරත්වය හෝ ඇලංකාරය නෙවෙයි. සම්මානයට පාත්‍රවන පුද්ගලයන් කවුරුන්ද? ඔවුන් ඒ සම්මානය සඳහා තෝරාගනු ලැබුවේ කවුරුන් විසින්ද? ඒ කුමන පදනමකින්ද? ඒ සඳහා යොදා ගත් මිණුම් දඬු මොනවාද? ඒවා තමයි වැදගත්.

මේ සම්මාන උළෙලේ මේ සේරම මට නම් මාර අවුල්. සම්මාන හිමිවූවන් ගැන මගේ පෞද්ගලික අමනාපයක් නැහැ. මගේ ප්‍රශ්නය තියෙන්නෙ මේ වගේ ප්‍රෝඩාවල් සංවිධානය කරන අය ගැනයි.

මිනිස්සුන්ගෙ අහිංසක ආසාවල් තමන්ගෙ මඩිය තරකාරගන්න පාවිච්චිවෙන හැටි දකිනකොට මට හිතෙන්නේ ඒක මහා අපයෝජනයක් කියලයි.

සම්මාන ලෝභයෙන් වේදිකාවට නගින අයත් කල්පනා කරන්න ඕනෙ මේ බහුබූත දිහා සමාජය අවඥාවෙන් බලාගෙන ඉන්න බව. සත පහක වටිනාකමක් නැති මේ විකාර සම්මාන පස්සෙ දුවන ඒ අය කරන්නෙත් අර කපටි නරිය ඉස්සරහා කුකුල් බිලි ගොඩ ගහපු මෝඩ ගමරාළ කරපු කාර්යම තමයි.

මනෝ ඔබ විශිෂ්ටයි

අමාරුවෙන් අන්දරේලා සහ ගුරු තරුව නාට්‍ය දෙකම එකම දවසේ බැලුවා. ඉස්සර එකම එක දවසක් හුවර වෙම්බිලි එකේ දෙකයි තිහේ ෂෝ එකයි හයයි තිහේ ෂෝ එකයි බැලුවට පස්සෙ එකම දවසෙ ෆිල්ම් දෙකක් හරි නාට්‍ය දෙකක් හරි බලලම නැහැ. මනෝ අයියා කිව්වා වගේ ඒගොල්ලොත් පළමුවෙනි වතාවට තමයි එකම දවසේ නාට්‍ය දෙකක් පෙන්නලා තියෙන්නෙ. ඒත් මොන තරම් වෙහෙසකර වුණත් ෂෝ දෙකටම ශාලාව පිරෙන්න ඇවිත් හිටිය අපේ රසික රසිකාවියන් දැක්කම හිතේ ඇති වුණේ ලොකු සතුටක්. සැබෑ නාට්‍යයක රසය විඳින්නට කැමති විශාල ප්‍රේක්ෂකාගාරයක් තියෙන එක අපට ආඩම්බරයක්. මං එහෙම කිව්වෙ පහුගිය කාලය පුරාවටම දකින්න ලබුණ "කිඹුලෝ මැටි ගිලිති" "හුණෝ අඬති" "මට බඩගිනියි" වගේ බහුබූත නම් වලින් එන විසූක දස්සන නරඹලා අපේ ප්‍රේක්ෂකයන් වල්මත් වෙලා ඇද්දෝ කියලා පුංචි සැකයක් හිතේ තිබුණ නිසා. ඒ බහුබූත බලලා අපි ගෙදර ආවෙ හිස් අතින්. ඒත් එදා මනෝ අයියගෙ නාට්‍ය දෙක බලලා ගෙදර එනකල් අපට කතා කරන්න කල්පනා කරන්න කොයි තරම් දේවල් තිබුණද?

ජයලත් මනෝරත්න කියන නොසැළෙන කලාකරුවාට අපි සැමදා ගෞරව කරන්නෙ ඒ නිසයි.

මනෝ අයියත් එක්කලා මෙහෙ ආව නාට්‍ය කණ්ඩායම වතාවක් ෂොපින් සෙන්ටර් එකක ඉන්නවා මං දැක්කා. මුළින්ම දැක්කේ ඔවුන් වින්ඩෝ ෂොපින් කරන ආකාරය. ඊට පස්සෙයි ළඟට ගිහින් කතා කළේ. කතා කරද්දි හිතුණේ මේත් අපේම සහෝදරයන් සහෝදරියන් නේද කියන එක. අපි වගේම ජීවත් වෙන්න අරගල කරන අපේම පන්තියේ මිනිස්සු. අර ගුරු තරුවෙ කියනවා වගේ අපේ පන්තිය තේරුම් ගන්න එක හරිම වැදගත්.

දර්ශන දෙකටම ශාලාව පිරෙන්න සෙනග හිටියත් 14 දෙනෙක් ලංකාවෙන් ගෙන්වා පෙන්වන මෙවන් නාට්‍ය වලින් මහා විශාල ආර්ථික වාසි ගන්න බැරි බව අපි දන්නවා. නමුත් මෙවන් නාට්‍ය සංවිධානය කිරීමෙන් අර කලාකාරයන්ට යම් ආර්ථික වාසියක් ලැබෙනවා නම් ඒ ගැන තමයි අපි සතුටු වෙන්නෙ. ඒ නිසා අවදානමක් අරගෙන හොඳ සැබෑ නාට්‍ය ගෙන්වා ප්‍රදර්ශනය කරන දර්ශන සංවිධායකයනට අපේ ආචාරය හිමිවෙනවා. ඒ එක්කම විසූක දස්සන වලින් අයාලේ යමින් සිටින මෙල්බන් ප්‍රේක්ෂකාගාරය හරි පාරට දාගන්න ඔබ කරන සේවය වැදගත්. ඒ අර්ථයෙන්ම මේ නාට්‍ය දෙක සංවිධානය කළ 3LO සංවිධානයට මෙන්න මගෙන් පහක්.

පියවරුන්ගේ දිනය ගැන පමාවුණ සටහනක්

පහුගිය සැප්තැම්බර් මාසේ පළමුවෙනි සතියේ පියවරුන්ගේ දිනය සැමරුවානේ. අවංකව කියන්නේ මමත් මෙහෙට සෙට් වෙලා සෑහෙන කාලයක් ගනකම්ම මේ පියවරුන්ගේ දිනය සැමරීම ගැන බැලුවේ උපහාසයෙන් කිව්වොත් නිවැරදියි. හැමදාම දෙමව්පියන් ආදරය කරන අපිට මොකටද ඒ වෙනුවෙන් විශේෂ දිනයක් කියලා නන්දක්කලා සින්දුත් කියලා තියෙන්නෙ. ඒත් ගොයියෝ දින මාස අවුරුදු දස අවුරුදු වෙලා මෙහේ සංස්කෘතියට අනුගත වෙලා ජීවිතේ හිරවෙලා තද වෙලා ගලා යන්න පටන් ගත්තමනේ මෙහේට එහෙම එකක් තියෙන එක හොඳයි

කියලා දැනෙන් ගත්තේ.

සැප විඳිනව කියන්නේ එක විදිහකට නිදහස නැති වෙනවා වගේ දෙයක්නේ. මෙහේදි සැප විඳින්න සල්ලි එපායැ. සල්ලි හොයන්න වැඩ කරන්න එපායැ. වැඩියෙන් සල්ලි හොයන්න වැඩියෙන් වැඩියෙන් වැඩ කරනකොට අපේ පෞද්ගලික ජීවිතේ තියෙන බැඳීම් වලින් ටික ටික ඈත්වෙන්න වෙනවා. ඒක අඹු දරුවන්ගෙන් පටන්ගෙන හදපු වඩපු දෙමාපියන් දක්වා පැතිරෙන්නේ අපට නොදැනුවත්වම්. ඒ නිසා ඒ දුරස්වෙන සෙනෙහස ළඟාකරගන්න අවිවේකී බවෙන් මිදිලා ඒ සඳහාම

දිනයක් වෙන් කර තිබීම මේ සිස්ටම් එකේ හැටියට වඩා සුදුසුයි කියලා තේරෙන්න කාලයක් යනවා. දෙමාපියන්ට හැමදාම සළකපු කාලයක් තිබුණ තමයි. දැනුත් අපි එහෙමයි කියලා කියනව නම් ඒක පට්ට බොරුවක්. අපි ආදරයි තමයි හදවතින්. ඒත් හිතේ හැටියට සළකගන්න බැහැ. වෙලාවක් නැහැ. ඒක ලංකාවටත් පොදු සත්‍යයක්. මෙහේදි මගේ දරුව මට එයාගෙම ශ්‍රමයෙන් උපන්දින කාඩ් එකක් හදලා මට ගෙනත් දෙනකොට මට මතක් උනේ අපි බොහොම දෙනෙක් කවදාවත් අපේ දෙමාපියන්ට එහෙම කරලා තියෙනවද කියලා. අපට එහෙම සංස්කෘතියක් නොතිබුණ බව ඇත්ත. ඒක නිදහසට කාරණාවක් නෙවෙයි. අපි යාලුවෙලා හිටපු ගෑනු ළමයින්ට බොහොම හරි කාඩ් යවලා නැද්ද? යැව්වනේ. නිකමට හරි අපි අපේ දෙමාපියන්ට එහෙම දෙයක් කළා නම් ඒ අයට මොන තරම් අහිංසක සතුටක් දැනෙන්න තිබුණද කියලා හිතෙන්නේ දැන්. අපි ඒ සෙනෙහස විඳින කොට. මං නිකමට මේ ගැන මගේ මිත්‍රයෙකුට කියනකොට ඔහු කිව්වෙ "මචං මං අපේ දෙමාපියන්ගෙ උපන්දින වත් දැනගෙන හිටියේ නැහැ" කියලයි.ඒහෙම අපි පියවරුන්ගේ දිනයට හිනා වෙනවා. චූටි මල්ලි නම් කියන්නෙ ඔස්ට්‍රේලියාවේ පියවරුන්ගේ දිනයට ජයවේවා කියලයි.

බලය අතහැර යාමේ ආදර්ශය

අනිත් මිනිස්සුන්ට කොහොම උනත් මට නම් මාර විදිහට වදුණ සීන් එකක් වුණා පහුගිය දවසක පෙන්වපු ටෝනි ඇබට් ගේ නිල නිවසින් සමුගෙන යන දර්ශනය. මම පුරවැසිකම ලැබුණ දා ඉඳන් ඡන්ද දුන්නෙ ලේබර් එකට. දැනුත් මම ඉන්නෙ එතන.

ඉස්සර කොහොම වුණත් දැන් දැන් එහෙයි මෙහෙයි කියලා එතරම් වෙනසක් නැහැ බලය අත්පත් කරගැනීමේ ක්‍රමවේදයෙන් නම්. ජන්දෙන් පත්වුණ අගමැති එක රැයෙන් එළියට යවලා අලුත් කෙනෙක් ඇවිත්. කිසි අවුලක් නැහැ. ඉන්න බැරි කට්ටිය විශ්‍රාම ගන්නවා.

වඩා වැදගත් වෙන්නෙ බලය ලබා ගැනීම නෙවෙයි. බලය අහිමි වූවන් එය අතහැර සමුගන්නා ආචාරශීලී ක්‍රමවේදයයි. ආදර්ශයට ගත යුත්තේ එයයි. මහජන ජන්දයෙන් පත්වුණ ටෝනි ඇබට් බලය අහිමි වූ පසු මහත්මයකු ලෙස සමුගෙන යන ආකාරය මට නම් තදින් දැනුණා. ඔහු ගෙදරින් යන්නට සූදානම් වී තමන්ගේ වාහනයේ වහල උඩ තිබුණ බෝට්ටුව ලණුවකින් තමන්ම ගැට ගසා ගන්නා ආකාරය ටීවී නිවිස් වලට පෙන්නුවා. වාහනයේ සයිඩ් ස්ටෙප් එක උඩ නැග ලණුව ගැට ගසා අත් පිස දමමින් ඔහු කැමරා කරුවන් දෙස බැලුවේ මඳ සිනා සහිත මුහුණකින්. ඒ දර්ශනය මට උනත් වැදුනේ මං හිතන විදියට අපට එහෙම දේවල් නුහුරු නිසා.

අපේ නායකයන්ගේ සමුගැනීම් ගැන අපි කොහොම ලියන්නද? ලැප්පාවේ පණ යනවා. ටෝනිගේ සමුගැනීමෙදි කතා ශෝක ප්‍රකාශ ගිහිකෙළි අපහාස මොනාවත් නැහැ. ආවා. බඩු මුට්ටු පැක්කරගත්තා. ප්‍රකාශයක් කළා. ගියා. ආදර්ශය කියන්නේ ලොක්කා මැරෙන්න හිතෙනවා මේවා දැක්කම.

චූටි මල්ලි